# ළමා නිවාසයේ දඟකාර විශ්‍රාන්තිය

එම්.ටී.ඩී. මොරවක

නිකිණි නේත්‍රාංජලි බණ්ඩාර ක්ෂේත්‍රයේ වැජඹෙන කතුවරියකි. ඇය විසින් රචිත 2012 ප්‍රථම වරට ප්‍රකාශයට පත් කරන ලද ටුටු දූපතේ මායාව ග්‍රන්ථයෙහි විශ්‍රාන්තිමය අවස්ථා මෙලෙස ගෙන හැර දක්වමි. ඇය පෙරවදනෙහි ළමුන්ට, වැඩිහිටියන්ට හොරෙන් ලොකු වැඩ කිරීමට අනුබල දීමක් නොකරන බව පෙන්වා දී ඇත, ඇය දරුවන්ගේ විශ්‍රාන්තිමය අවශ්‍යතා ඇගේ සුමට වදන් මගින් ගෙන හැර දක්වූවාය. නිකිණි බණ්ඩාර කතුවරියගේ අනෙකුත් කෘති ලෙස තරු සිත්තම් ආගන්තුයා, ආදරණීය හැන්දෑව රිදී මුදුව දැක්විය හැකිය. ටුටු දූපතෙහි මායාවෙහි පිටු 150 ක් වූ අතර පරිච්ඡේද 13 ක් විය. ජේම්ස් ළමා නිවාසය, දරුවන්ගේ නවාතැන්පල විය. දරුවන් ඔවුන්ගේ ජීවිතයේ මිහිරියාවක් ලබා ගැනීමට හොර රහසේ කළ ත්‍රාසජනක වූ විශ්‍රාන්තිමය ක්‍රියාදාමයන් ඇය ලියා තිබුණාය.

''සුදු අම්මා'' ඔවුන්ගේ පාලිකාවයි. එක් දවසක් ජේම්ස් ළමා නිවාසය අසල වෙරළ තීරයට මහා විශාල නැවක් නැංගුරම් ලෑවේ ළමා ලපටින්ගේ සිත්මල් සතුටින් පුරවමිනි. එදා නම් සුදු අම්මා පොඩ්ඩක් විතර වෙනස් වෙලා හැමෝටම පොඩි සහනයක් දුන්නා. නැවෙන් ආපු අයත් එක්ක නැව බලන්න සුදු අම්මා වෙරළේ හිටපු දරුවෝ හැමෝ ම එක්කගෙන ගියා. ක්‍රිස්ටිනුයි, බීනුයි දෙන්නා හිතා මතාම පහු වුනා. ''අන්න සුදු අම්මා එනවා.... අපි ඇතුළට ගියොත් නැවේ මාමාලා එක්ක කථා කරන්න වෙන්නෙ නෑ.''

''ම්.... අපි හැංගෙමු.'' දෙන්නා ඉක්මනට ඒ ළඟම තිබුණු ගලක් අස්සේ හැංගුණා. සුදු අම්මා ළඟටම ඇවිත් කවුරුත් නැති නිසා හැරිලා ගියා. ''හරි අපිව දැක්කේ නෑ'' කථාවුන විදිහටම දෙන්නා ම හැංගිලා ඉඳලා හෙමින් සැරේ නැව පැත්තට ගියා. සතුට වැඩි කමට සපත්තු දෙකේ වැදිලා වැලි උඩ විදිවෙන තරමට වේගයෙන් ඇවිද්දා. මාමේ, මාමේ, කවුද මේ නැව මුහුද මැදින් ගෙනාවේ. අනේ මාමේ අපි දෙන්නාව නැව පදවන තැනට එක්ක යනවා ද? ' 'ම්....යමු.... ' දෙන්නා නැව පුරා දිව්වා.... කළුවර වැටෙන්නත් ළඟයි. දෙන්නා ස්තුති කරලා ජේම්ස් හවුස් එකට රිංගන්න උත්සාහ කළා. සුදු අම්මා කුස්සියට යන වේලාව එනතුරු තාප්පය ළඟ හැංගිලා ඉඳලා හෙමින් සීරුවේ කාමරයට රිංගා ගත්තා.

ඉර හැරෙන්න කලින් පොඩ්ඩෝ හතර දෙනා අවදි වුණා. දෙන්නෙක් කලින්ම ගිහින් තාප්පෙ ළඟ නතරවේලා බලාගෙන හිටියේ අනිත් දෙන්නා එනතුරු. ''ඇති යාන්තං. අන්න අර දෙන්නා එනවා....'' මේ ඔය දෙන්නා කඩේ යන්න වාගේ මොකද බෑග් එකක් අරගෙන අහුනානම් හෙම.......'' අපි චොක්ලට් ටිකකුයි, බිස්කට් ටිකකුයි ගත්තා.... ආ.... වතුර බෝතලයකුත් ගත්තා'' අපි යන්නේ ළඟට මෝඩියේ ! සුදු අම්මා ඇහැරෙන්න කලින් එන්නත් ඕනි....''නෑ ඉතිං..... මම නිකමට ගෙනාවේ ...... විහිළුවට වාගේ. බයක් සැකක් නැතුව හතර දෙනාම බෝට්ටුවට නැගලා සද්ද නොකර වෙරළෙන් පිටවූනාට ටිකක් ඈතට ගිහින් මහ හයියෙන් කථා බහ පටන් ගත්තා.''මම බෝට්ටුවක් අරගෙන යන පළවෙනි දවස'' ''එහෙම කියනකොට නං බයක් හිතනවා.'' ම්...ම්....ම්... කට කට .... ගමනක් යනකොට ඒවාගේ දේවල් කියන්නේ නෑ. අර බලන්නකො..... අපි ගොඩබිමෙන් කොච්චර ඈත ද? අන්න දූපත.... සද්ද කරන්න එපා....අන්න...ඩොල්ෆින් ....ෂා හරිම ලස්සනයි. අන්න රංචුවම ...ළඟට යමු.... අර....ඒ පාර තවත් අය ඇවිත්.... වතුර පාරවල් කීපයක් උඩට යනවා.... ඊළඟ දවසේ අපි සුදු අම්මට හොරෙන් ටුටු දූපත ඇතුළට යමු. අදට ආපහු යමු. සුදු අම්මේ..... සුදු අම්මේ...අපි එනවෝ... හතර දෙනාම සතුටින් ආපහු හැරුනා. සතුට පිරුන වදන් මැදින් වෙරළට සේන්දු වූ කුඩා දරුවන් හතරදෙනා මීයට පිම්බාක් සේ නිසොල්මන්ව වෙරළ දිගේ හෙමින් හෙමින් ඇවිද ළමා නිවාසය තුලට රිංගා ගත්තහ. නිකිණි නේත්‍රාංජලි බණ්ඩාරගේ සුරම්‍ය බස්වහර තුළින් ජෙම්ස් ළමා නිවාසයේ සිරගතවූණු දඟකාරයන් විශ්‍රාන්තිය සොයා ගිය.... ආකාරය පැහැදිලි වෙයි.

බණ්ඩාර නේත්‍රාංජලි, (2012) ටු ටු දූපතෙහි මායාව, නිව් කැලණි ප්‍රින්ටර්ස්, අංක 751, හිඹුටුවැල්ගොඩ, කැලණිය.